## කොළඹ විශ්වවිද්‍යාලයට අනුබද්ධිත දේශීය වෛද්‍ය විද්‍යායතනය - 2010

-----------------------------------------------------------------------------

### 1. මූල්‍ය ප්‍රකාශන

---------------

### 1.1 මතය

-------

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව දේශීය වෛද්‍ය විද්‍යායතනය 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත්, මෙම වාර්තාවේ 1.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් මූල්‍ය ප්‍රකාශන වලට වන බලපෑම හැර 2010 දෙසැම්බර් 31 දිනට දේශීය වෛද්‍ය විද්‍යායතනයේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතුවල මූල්‍ය ප්‍රතිඵල හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවත් මා දරන්නා වූ මතය වේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

----------------------------------------

#### 1.2.1 ගණුම්කරණ අඩුපාඩු

----------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) අධ්‍යයන කාර්ය මණ්ඩලයේ 50 දෙනෙකු සඳහා 2010 දෙසැම්බර් 31 දින තෙක් රු.17,764,292 ක පාරිතෝෂිත මුදල් වෙන්කර නොතිබූ අතර අනධ්‍යයන කාර්යය මණ්ඩලය සඳහා පෙර වර්ෂයන්හි සිදුකර තිබූ ගණනය නොකරන ලද ඌන වෙන් කිරීම්ද සමාලෝචිත වර්ෂයේ ආදායම් වියදම් ගිණුමට ගලපා තිබුණි.

(ආ) භෛසජ්ජක පාඨමාලාවේ සමාලෝචිත වර්ෂයේ රු.1,410,000 ක් වූ පාඨමාලා ගාස්තු ආදායම හා රු.639,164 ක් වූ වියදම්, ආදායම් වියදම් ගිණුමේ ඇතුළත් කර නොතිබුණි.

(ඇ) පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාව සඳහා සමාලෝචිත වර්ෂය අවසානයේදී හිඟ හිටි රු.1,581,667 ක් වු ආදායම ගිණුම්ගත කර නොතිබුණි.

(ඈ) 2006 සිට 2010 වර්ෂය දක්වා කාලය තුළ බැංකු ප්‍රකාශයන්හි සඳහන්ව තිබූ රු.775,488 ක සෘජු බැර කිරීම් හඳුනාගෙන නියමිත ගිණුම්වලට සටහන් කිරීමට කටයුතු නොකර විවිධ තැන්පතු ගිණුමට බැර කර තිබුණි.

(ඉ) පළමු වසර සිසුන් වෙත ගෙවා තිබූ රු.300,000 ක මහපොළ අත්තිකාරම් මුදල 2010 නොවැම්බර් 18 දින ප්‍රතිපූර්ණය කරගෙන තිබුණද, එම අත්තිකාරම් ගිණුම නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

### 1.2.2 නිරවුල් නොකළ ගිණුම් ශේෂ

------------------------------

ජංගම වගකීම් ගිණුම් 04 ක වසර ගණනාවක සිට ඉදිරියට එමින් පවතින රු.87,031 ක් වූ ශේෂ, තැන්පතු ගිණුම් 03 ක වසර 02 ක ඉක්මවූ රු. 534,783 ක් වූ ශේෂ, ඉදිකිරීම් කොන්ත්‍රාත්තුවට අදාල වසර 04 ක් ඉක්මවූ රු. 1,593,064 ක් වූ ආරක්ෂක තැන්පතු සහ "නොගෙවූ විභාග ගාස්තු" ගිණුමේ වසර කිහිපයක සිට එකතු වෙමින් පැවති රු.127,296 ක ශේෂය, නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

### 1.2.3 අනුචිත හෙළිදරව් කිරීම්

--------------------------

පර්වාස කථිකාචාර්යවරුන්ගේ පර්යේෂණ කටයුතු, පාරම්පරික දැනුම පිළිබඳ සම්මන්ත්‍රණය සහ පෙරදිග වෛද්‍ය විද්‍යා අරමුදල යන විශේෂ කාර්යයන් සඳහා බාහිර පාර්ශව වෙතින් වර්ෂ කිහිපයක් තුළ ලැබී තිබූ අරමුදල් හා එම වියදම් වෙනම ලෙජර් ගිණුම්වල සටහන් කරනු වෙනුවට විවිධ තැන්පතු ගිණුමේ සටහන් කර තිබුණි. මෙකී ගණුදෙනු පැහැදිලිව හඳුනාගත නොහැකි හෙයින් ගණනය කළ නොහැකිව පැවතුණි.

### 1.2.4 නොසසඳන ලද පාලන ගිණුම්

-------------------------------

මූල්‍ය ප්‍රකාශනයන්හි දැක්වෙන පහත සඳහන් ගිණුම් විෂයයන් අදාල උපයෝගී ලේඛන / වාර්තා සමඟ නොසැසඳීම නිසා එම ශේෂ නිවැරදි බවට විගණනයේදී තහවුරු කර ගත නොහැකි විය.

| ගිණුම් විෂයය | | ගිණුම අනුව ශේෂය | උපයෝගී ලේඛනය / වාර්තාව | උපයෝගී ලේඛනය/ වාර්තාවේ සඳහන් වටිනාකම | වෙනස |
|---|---|---|---|---|---|
| | | රු. | | රු. | රු. |
| (අ) | සරත් රණසිංහ අරමුදල - ආයෝජන ගිණුම | 60,966 | බැංකු ශේෂ සනාථ කිරීම | 86,264 | 25,298 |
| (ආ) | ආපදා ණය | 19,162,824 | උපලේඛනය | 18,952,910 | 209,914 |
| (ඇ) | වාහන ණය | 2,271,215 | එම | 2,251,354 | 19,861 |
| (ඈ) | සේවක ණය | 371,269 | එම | 325,890 | 45,379 |
| (ඉ) | පරිගණක ණය | 913,960 | එම | 891,500 | 22,460 |
| (ඊ) | උත්සව අත්තිකාරම් | 265,649 | එම | 223,800 | 41,849 |
| (උ) | ගබඩා අත්තිකාරම් | 884,430 | භෞතික තොග සමීක්ෂණ වාර්තාව | 1,255,494 | 371,064 |

### 1:2:5 විගණනය සඳහා සාක්ෂි නොවීම

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන පහත සඳහන් විෂයයන් ඒවා ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි නොවීම හේතුවෙන් විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාක්ෂණය කිරීමට නොහැකි විය.

| | විෂයය | වටිනාකම | ඉදිරිපත් නොකළ සාක්ෂි |
|---|---|---|---|
| | | රු. | |
| (අ) | අවලංගු කළ චෙක්පත් ගිණුමේ 2010 ජනවාරි 01 දිනට ශේෂය | 312,231 | උපලේඛනය |
| (ආ) | බානගල අරමුදල | 10,050 | ලිපිගොනුව |
| (ඇ) | නේවාසිකාගාර තැන්පතු | 25,000 | ලිපිගොනුව/ බැංකු ශේෂ සනාථ කිරීම් |
| (ඈ) | ටෙන්ඩර් තැන්පතු (ආපසු ගෙවිය යුතු) | 130,256 | විධිමත් ලේඛනය |
| (ඉ) | පුස්තකාල තැන්පතු | 59,460 | විධිමත් ලේඛනය |
| (ඊ) | නේවාසිකාගාර තැන්පතු | 180,767 | විධිමත් ලේඛනය |
| (උ) | සම්පූර්ණයෙන් ක්ෂය කර අවසන් වූ ලෙස සැලකූ ස්ථාවර වත්කම් පිරිවැය | 59,141,389 | විධිමත් ලේඛනය |

### 1:2:6 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවීමේ අවස්ථා නිරීක්ෂණය විය.

| නීති, රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) 1978 අංක 16 දරන විශ්ව විද්‍යාල පනත 109 වගන්තිය | විගණනය කරන ලද 2009 වාර්ෂික මූල්‍ය ප්‍රකාශන රජයේ ගැසට් පත්‍රයේ පළ කර නොතිබුණි. |
| (ආ) 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | 2001 වර්ෂයේදී රු.171,243 ක වියදමකින් පෞද්ගලික ආයතනයක් ලවා ලේඛනගත කර තිබූ ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීනව පවත්වාගෙන ගොස් නොතිබුණි. |
| (ඇ) 2002 නොවැම්බර් 28 දිනැති අංක IAI/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | පරිගණක උපාංග හා මෘදුකාංග සම්බන්ධයෙන් වෙනම ලේඛනයක් නඩත්තු කර නොතිබුණි. |
| (ඈ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි (මු.රෙ.) | |
| (i) මු.රෙ. 103 | 2009 භාණ්ඩ සමීක්ෂණ වාර්තාවේ ඇතුළත් භාණ්ඩ ඒකක 1303 ක ඌනතා සම්බන්ධයෙන් ක්‍රියාකර නොතිබණි. |
| (ii) මු.රෙ. 396 | කල් ඉකුත් වී අවලංගු කොට නැවත නිකුත් කරන ලද රු.65,688 ක් වටිනා චෙක්පත් 05 ක අවලංගුව හා නැවත නිකුත් කිරීම "අවලංගු කළ චෙක්පත් ගිණුම" හරහා සිදු කොට නොතිබුණි. |

## 2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

-----------------------------------

### 2:1 මූල්‍ය ප්‍රතිඵල

----------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විද්‍යායතනයේ වැඩ කටයුතු වලින් සිදුවී ඇති මූල්‍ය ප්‍රතිඵලය, පුනරාවර්ථන වියදම් සඳහා රජයේ ප්‍රදානය ගණන් ගැනීමට පෙර රු.142,942,199 ක ඌනතාවයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.122,861,768 ක් විය. සමාලෝචිත වර්ෂයේ පුනරාවර්ථන වියදම් සඳහා ලැබී තිබුණු රු.104,100,000 ක් වූ රජයේ ප්‍රදානය හේතු කොට ගෙන එම ඌනතාවය රු.38,842,199 ක් දක්වා අඩු වී තිබුණ අතර, ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම් සඳහා ලැබී තිබුණු රු.106,094,000 ක් වූ රජයේ ප්‍රදානය හේතු කොට ගෙන එම ඌනතාවය රු.16,767,768 ක් දක්වා අඩු වී තිබුණි. ඒ අනුව පෙර වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු.22,074,431 කින් තවදුරටත් පිරිහී තිබුණි.

### 2:2 මෙහෙයුම් සමාලෝචනය

---------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කෙරේ.

#### 2:2.1 කාර්ය සාධනය

------------------

(අ) ක්‍රියාකාර සැලැස්මෙහි ඇතුළත් පහත සඳහන් කාර්යයන් හතරක් ඉටුකර නොතිබුණි.

i. ශික්ෂණ රෝහල් වාර්තා යාවත්කාලීන කිරීම.
ii. විකෘති විඥාන විෂයේ දැනට පවත්නා ප්‍රයෝගික පුහුණු වැඩසටහන් සමාලෝචනය.
iii. කාර්ය සාධන ඇගයීමේ ක්‍රියාවලිය වඩා කාර්යක්ෂම කිරීම.
iv. ඖෂධීය ශාඛ සංරක්ෂණය සඳහා කමිටුවක් පත් කිරීම.

(ආ) අධ්‍යයන කටයුතු

-------------------

ආයුර්වේද වෛද්‍ය හා ශල්‍යවේදී සහ යුනානි වෛද්‍ය හා ශල්‍යවේදී උපාධි පාඨමාලාවන් සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කෙරේ.

(i) උපාධි පාඨමාලාවන්හි විෂය නිර්දේශ 1983 වර්ෂයෙන් පසුව සංශෝධනය වී නොතිබුණි.

(ii) අධ්‍යයන වර්ෂය ආරම්භයේදී ඒ ඒ විෂයයන්ට අදාලව විධිමත් දේශන සැලැසුම් සකස් කර නොතිබුණි.

(iii) මුළු විෂයයන් 31 ක් වූ ආයුර්වේද පාඨමාලාවේ විෂයයන් 28 ක් සඳහාම එක් විෂයයක් වෙනුවෙන් දේශකවරුන් 2ත් 8ත් අතර ප්‍රමාණයක් අනුයුක්ත කර තිබූ නමුත් ඒ ඒ දේශකවරයාට අදාළ විෂය කොටස් පිළිබඳව විධිමත් පැවරීමක් සිදු කොට නොතිබුණි. ඇතැම් ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරු ප්‍රායෝගික පුහුණු කටයුතු ඇතුළුව අධ්‍යයන කටයුතු සඳහා ඉතා අඩු දායකත්වයක් දක්වා තිබුණි.

(iv) ශිෂ්‍ය පැමිණීමේ ලේඛන නඩත්තු කිරීමේ අසම්පූර්ණ හා අවිධිමත්භාවය හේතුවෙන් විෂය මාලාවන් සම්පූර්ණයෙන් ආවරණය කළ බවට විගණනයේදී තහවුරු නොවීය.

(v) බාහිර කථිකාචාර්යවරුන් 29 දෙනෙකුගේ සේවය ලබාගෙන තිබුණද, විධිමත් කාර්ය පැවරීමක් හා නිසි අධීක්ෂණයක් සිදු කර නොතිබුණි.

(ඇ) ලියාපදිංචි වූ සිසුන් පාඨමාලාව සාර්ථකව අවසන් නොකර අධ්‍යයන කටයුතු හැර යන තත්ත්වයක් හා විභාග අසමත් වන තත්ත්වයක් පසුගිය වර්ෂ කිහිපය තුළම වර්ධනය වෙමින් පැවති අතර ඒ පිළිබඳව කළමනාකරණයේ අවධානය යොමු වී නොතිබුණි.

| ඇතුළත් වූ අධ්‍යයන වර්ෂය | ඇතුළත් වූ ශිෂ්‍ය සංඛ්‍යාව | 5 වන වසර වන විට රැඳී සිටි සංඛ්‍යාව | 5 වන වසර සමත් වූ සංඛ්‍යාව | ප්‍රතිශතය % |
|---|---|---|---|---|
| 2003/2004 | 102 | 67 | 45 | 44 |
| 2003/2004 (A) | 78 | 62 | 50 | 64 |
| 2002/2003 | 95 | 86 | 63 | 66 |
| 2001/2002 | 101 | 80 | 58 | 57 |
| 2000/2001 | 98 | 54 | 43 | 44 |
| 1999/2000 | 114 | 73 | 53 | 46 |

2.2.2. **කළමනාකරණ අකාර්යක්ෂමතා**

---------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කෙරේ.

(අ) **ශිෂ්‍යාධාර හා මහපොළ ගෙවීම්**

---------------------------------

(i) 2009/2010 අධ්‍යයන වර්ෂය තුළ උද්යෝගීමත් ලෙස අධ්‍යයන කටයුතුවල නොයෙදුනු සිසුන් දසදෙනෙකු සඳහා චක්‍රලේඛ විධිවිධානවලින් බැහැරව දිගටම ශිෂ්‍යාධාර ගෙවා තිබූ අතර, එයින් තුන් දෙනෙකු 2008/2009 අධ්‍යයන වර්ෂයේ විභාග සඳහාද පෙනී සිට නොතිබුණි.

(ii) ශිෂ්‍යාධාර හා මහපොළ මුදල් නොගෙවූ සිසුන් සඳහාද කොමිෂන් සභාව වෙතින් එකී මුදල් ප්‍රතිපූර්ණය කර ගැනීම හේතුවෙන් 2010 දෙසැම්බර් 31 දිනට නොගෙවූ ශිෂ්‍යාධාර ගිණුමේ රු.1,415,900 ක්ද නොගෙවූ මහපොළ ගිණුමේ රු. 129,550 ක්ද ශේෂ වී තිබුණි. මේ සඳහා විස්තරාත්මක උප ලේඛනයක්ද ඉදිරිපත් කර නොතිබුණි.

(iii) චක්‍රලේඛ විධිවිධාන පරිදි මහපොළ හා ශිෂ්‍යාධාර සම්බන්ධ කමිටුවක් පත් කිරීම හා මාසික ප්‍රගති වාර්තා සකස් කිරීම සිදු කර නොතිබුණි.

(ආ) **ආයුර්වේද / යුනානි දර්ශනපති පාඨමාලාව**

--------------------------------------------

මෙම පූර්ණ කාලීන පාඨමාලාව සඳහා අයවැය ලේඛනයක් සහ වියදම් වාර්තා සකස් කර නොතිබූ අතර, සහාය කාර්ය මණ්ඩලයේ කළ යුතු කාර්යයන් පිළිබඳ පූර්ව හඳුනා ගැනීමක් සහ කරන ලද කාර්යයන් පිළිබඳ නිශ්චිත සාක්ෂිද නොමැතිව ආයතනයේ අංශ 09 කට අනුයුක්ත කර සිටි නිලධාරීන් 84 දෙනෙකු සඳහා පාඨමාලාවට සහාය වීමේ දීමනා ලෙස රු.630,900 ක් ගෙවා තිබුණි.

(ඇ) **පුස්තකාල සංවර්ධනය හා නඩත්තුව**

-------------------------------------

(i) සමාලෝචිත වර්ෂයේ අයවැයගත රු.1,500,000 ක මුදල සහ පශ්චාත් උපාධි අපේක්ෂකයන්ගෙන් අයකළ රු.272,000 ක මුදල පුස්තකාල සංවර්ධනය සඳහා ඵලදායී ලෙස යොදාගෙන නොතිබුණි. භාණ්ඩාගාර අනුමැතිය සහිතව මෙම රු.1,500,000 ක මුදල පුනරුත්තාපන හා වැඩි දියුණු කිරීම සඳහා මාරු කරන ලද බව අධ්‍යක්ෂවරයා දැනුම් දී ඇත.

(ii) චක්‍රලේඛ ප්‍රකාරව පුස්තකාල පොත් සම්බන්ධ වාර්ෂික තොග සමීක්ෂණයක් ආරම්භයේ සිට සමාලෝචිත වර්ෂය දක්වාම සිදු කොට නොතිබූ අතර, පුස්තකාල ගබඩාව තුළ යල් පැන ගිය හා හානි වූ පුස්තකාල ද්‍රව්‍ය ගොඩ ගැසී තිබුණි.

(ඈ) **ශිෂ්‍යත්ව හා ප්‍රදාන**

---------------------

පෙරදිග වෛද්‍ය විද්‍යා අරමුදල මගින් 2008/2009 අධ්‍යයන වර්ෂය සඳහා ලබා දුන් රු.25,000 ක ත්‍යාග මුදල් අදාළ සිසුන් වෙත පිරිනැමීමටත් 2009/2010 අධ්‍යයන වර්ෂයට අදාල ත්‍යාග මුදල් ලබා ගැනීමටත් කටයුතු කර නොතිබුණි.

(ඉ) **හිඟ හිටි සේවක ණය**

-----------------------

(i) සේවකයන් 06 දෙනෙකු වෙත ලබා දෙන ලද වසර 01 මාස 04 සිට වසර 08 ක් දක්වා කාලයක් හිඟ හිට තිබූ රු.1,044,815 ක් වූ සේවක ණය මුදල් අයකර ගැනීමට පියවර ගෙන නොතිබුණි.

(ii) සේවකයන් දෙදෙනෙකුට ලබා දෙන ලද රු.60,000 ක් වූ පරිගණක ණය මුදල් අය කර ගැනීම ආයතන සංග්‍රහයේ විධිවිධානයන්ගෙන් බැහැරව මාස 08 ක් හා 09 ක් ප්‍රමාද කොට තිබුණි.

2.2.3 **දුර්වල මූල්‍ය පාලනය**

-----------------------

(අ) ආයතනයේ පවතින දුර්වල මූල්‍ය පාලනය හේතුවෙන් ප්‍රේෂණ බැංකු ගත කිරීම සැලකිය යුතු ලෙස ප්‍රමාද කිරීමත්, දෛනික ප්‍රේෂණ එකතුවට වඩා වැඩියෙන් බැංකු ගත කොට ඊට පසු දිනයේ ප්‍රේෂණවලට හිලව් කිරීමත් සිදු කර තිබූ අතර සරපගේ දෛනික ලැබීම් පොත හා මුදල් බැංකුගත කිරීම් පිළිබඳ අධීක්ෂණයක්ද සිදු කොට නොතිබුණි.

(ආ) බැංකු ජංගම ගිණුම් 02 ක වර්ෂයක් ඉක්මවූ රු.4,027 ක් ඇතුළුව රු.17,854 ක් වූ හඳුනා නොගත් උපලබ්ධි නොවූ තැන්පතු 08 ක්ද, පර්යේෂණ බැංකු ජංගම ගිණුමෙහි මාස 09 කට පෙර ලියන ලද නමුත් අදාල ගෙවීම්ලාභීන් වෙත නොයැවූ රු. 9,100 ක් වටිනා චෙක්පත් 09 ක්ද බැංකු සැසඳුම් ප්‍රකාශයන්හි දක්වා තිබුණි.

**2.2.4 ඌන උපයෝජිත හා නිෂ්කාර්ය වත්කම්**

-----------------------------------------

**(අ) බැංකු ජංගම ගිණුම්වල නිෂ්කාර්යව මුදල් රැඳවීම**

-----------------------------------------------

(i) සමාලෝචිත වර්ෂයේ දැරූ මාසික ප්‍රාග්ධන වියදම රු. 50,850 ත් රු.1,543,700 ත් අතර පැවතියද ඒ සඳහා වූ බැංකු ජංගම ගිණුමෙහි රු. 3,819,000 ක සාමාන්‍ය මාසික මුදල් ශේෂයක්, රඳවා තිබූණි. 2010 දෙසැම්බර් 31 දිනට එකී ගිණුමේ ශේෂය රු. 5,656,120 ක් වී තිබුණි.

(ii) ලෝක සෞඛ්‍ය සංවිධානයෙන් ලැබුණු රු. 665,772 ක මුදලක් අදාල අරමුණට යෙදවීමකින් තොරව 2006 වර්ෂයේ සිටම නිෂ්කාර්යව බැංකු ජංගම ගිණුමක රඳවා තිබුණි.

**(ආ) නිෂ්ක්‍රීය වත්කම්**

----------------

වර්ග 18 කට අයත් රු.65,709 ක් වටිනා භාණ්ඩ ඒකක 4120 ක් වසර ගණනාවක සිටම නිකුත් වී නොතිබුණි.

**2.2.5 අරපිරිමැසුම් රහිත ගනුදෙනු**

------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කෙරේ.

**(අ) නඩු ගාස්තු ගෙවීම**

--------------------

ආයතන ප්‍රධානීන් ඇතුළු නිලධාරීන්ට විරුද්ධව පවරා තිබූ නඩු දෙකක් සඳහා ආයතන සංග්‍රහයේ XXXIII පරිච්ඡේදයේ 5 සහ 6 ඡේද ප්‍රකාරව නීතිපතිගෙන් උපදෙස් ලබා ගැනීමකින් තොරව පෞද්ගලික නීතිඥයන් වෙත පවරා නඩු ගාස්තු ලෙස රු.420,693 ක මුදලක් ගෙවා තිබූ අතර, පසුගිය වර්ෂයේ අවසන් වූ නඩුවක් සඳහාද මේ ආකාරයටම කටයුතු කරමින් පෞද්ගලක නීතිඥයන් වෙත රු.496,250 ක මුදලක් ගෙවා තිබුණි.

(ආ) චක්‍රලේඛ උපදෙස්වලට පටහැනිව, සාමාන්‍ය රාජකාර් කටයුතු සඳහා මසකට පැය 20 ඉක්මවා පැය 23,153 ක් සඳහා රු.2,711,343 ක අතිකාල මුදලක් 70 ක් වූ අනධ්‍යයන කාර්යය මණ්ඩලයෙ 66 දෙනෙකු වෙත ම ගෙවා තිබුණි.

2.2.6 අවිධිමත් ගනුදෙනු

--------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කෙරේ.

(අ) (i) සමාලෝචිත වර්ෂයේ අවස්ථා 08 කදී සිදු කරන ලද රු.2,230,889 ක් වටිනා භාණ්ඩ හා සේවා මිලදී ගැනීම් සම්බන්ධයෙන් මිල ගණන් කැඳවීම, මිල ගණන් භාර ගැනීම සහ මිල ගණන් විවෘත කිරීම, රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ උපදෙස්වලට පටහැනිව සිදු කර තිබුණු අතර, එම භාණ්ඩ වල තත්වය පිළිබඳව සුදුසුකම් ලත් පුද්ගලයකුගේ සහතික කිරීමකින්ද තොරව ගෙවීම් සිදු කර තිබුණි.

(ii) රු.723,330 ක් වටිනා භාණ්ඩ හා සේවා වර්ග 04 ක් මිලදී ගැනීම සඳහා විෂයය පිළිබඳ විශේෂඥතාවයක් සහිත තාක්ෂණික ඇගයීමේ කමිටු පත්කර එහි නිර්දේශ ලබාගෙන නොතිබුණි.

(ආ) අත්තිකාරම්

-------------

නේවාසිකාගාර මළ නල පද්ධතිය වැඩි දියුණු කිරීම සඳහා 2010 ඔක්තෝබර් 18 දින නිලධාරියෙකු වෙත ලබා දී තිබූ රු.30,000 ක අත්තිකාරම් මුදලින් අදාළ කාර්යය ඉටු නොකොට 2011 මාර්තු 15 දින ආපසු පියවා තිබුණි.

2.2.7 ක්‍රියාකාර සැලැස්ම

----------------------

2010 මුල් අර්ධ වර්ෂය සඳහා ක්‍රියාකාර සැලැස්මක් සකස් කොට නොතිබූ අතර අවසන් අර්ධ වර්ෂය සඳහා පිළියෙල කරන ලද සැලැස්ම, 2003 ජූනි 12 දිනැති අංක PED/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයෙහි 5.1.2 ඡේදයෙන් බැහැරව අසම්පූර්ණ තත්වයේ පැවතුණි.

2.2.8 කාර්ය සාධන වාර්තා

-----------------------

එම චක්‍රලේඛයේ 4.2.6 ඡේදය ප්‍රකාරව කාර්ය සාධන වාර්තා සකස් කර නොතිබුණි.

2.2.9 අයවැය ලේඛනය

------------------

අයවැයගත හා සත්‍ය ආදායම්, වියදම් අතර පැවති ප්‍රමාණාත්මක විචලතාවයන් හේතුවෙන් අයවැය ලේඛනය සඵල කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණි.

## 3. පද්ධති හා පාලන

--------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින් වර අධ්‍යක්ෂකගේ අවධානයට යොමු කරන ලද. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමු කළ යුතුය.

(අ) ස්ථාවර වත්කම් පාලනය

(ආ) ඉන්වෙන්ට්‍රි ලේඛණ පැවැත්වීම

(ඇ) අරමුදල් පාලනය

(ඈ) සැලසුම්කරණය හා අයවැය පාලනය

(ඉ) අතිකාල හා කාර්යය මණ්ඩල ගෙවීම්

(ඊ) අත්තිකාරම්

(උ) ගෙවිය යුතු ගිණුම්

(ඌ) ශිෂ්‍යත්ව ලබාදීම

(එ) අධ්‍යයන කටයුතු

(ඒ) ප්‍රසම්පාදන කටයුතු

(ඔ) සේවක ණය අයකර ගැනීම

(ඕ) පුස්තකාල සංවර්ධනය

(ක) ශිෂ්‍යාධාර හා මහපොළ ගෙවීම්